ශ්‍රී ලංකාවේ නර්තනය.

සාම්ප්‍රදායික නර්තනය හා බැඳුණු වෙස්මුහුණු කළාව හා පෙරහැර

ශ්‍රී ලංකාව වසර 2500 කට වඩා පැරණි අතීතයක් හිමි රටකි. විජය කුමරු හා පිරිස ලංකාවට පැමිණෙන විටදී කපු කරමින් සිටි කුවේනිය නම් වූ යක්ෂ ගෝත්‍රික කාන්තාවගේ සහ එම පිරිසගෙන් එය පැහැදිලිව සනාථ වේ. එම කාලවලදී පවා අපරටේ ගෝත්‍රික නැටුම් ගැයුම්, වැයුම් පැවති බවට ඉතිහාස පොත්වල සටහන් වේ. එම ශෛලීන් දිගින් දිගටම වර්ධනය වෙමින් පැවත ඒමේ ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ අපරටේ නර්ථන කළාව කොටස් තුනට කඩා දක්වා ඇත. ඒවා නම් උඩරට, පහතරට, සබරගමු නර්ථන ආදී ආකාරයට වේ.

පෙළගැස්ම.

විස්තරය	පිටු අංකය
✱ හැඳින්වීම	01
✱ නර්තන කළාවන් වල කෙටි හැඳින්වීම. – උඩරට – පහතරට – සබරගමු	02
✱ වෙස්මුහුණු කළාවේ ආරම්භය. – කෝලම් – දහ අට සන්නිය	03
✱ දහ අට සන්නිය විස්තරාත්මකව.	04, 05, 06
✱ දහ අට සන්නිය සිහිවටන පත්‍රිකා.	07
[illegible] ඉද්දරය සමග.	08

Philatelic Association of Sri Lanka (PASL)
www.philately.lk

උඩරට, පහතරට, සබරගමු, නර්තන කලාවන්.

උඩරට නර්තන කලාවේ ආරම්භය කොහොඹා කංකාරිය ශාන්ති කර්මයෙන් ආරම්භ වේ. මෙසේ ආරම්භ වූ නැටුම් කලාව දිනෙන් දින සංවර්ධනය වෙමින් ශ්‍රී ලංකාවේ මධ්‍යම කලකර ආශ්‍රිත ප්‍රදේශවල උඩරට නැටුම් සම්ප්‍රදායය නමින් ප්‍රචලිත විය. ප්‍රධාන ඇඳුම් කට්ටලය වෙසේ ඇඳුම් කට්ටල හා ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ගැට බෙරය දවේ. වන්නම් 1 ජනින් යුක්ත වේ.

පහතරට නර්තන කලාවේ ආරම්භය ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල විවිධ පරම්පරාවන් තුළින් එන එම් ජන සම්ප්‍රදායන් වලට අදාලව නැටුම්, ගැයුම්, ශාන්ති කර්ම, කෝලම් බලි කොවිල් පහතරට නර්ථනයට අයත් වේ. මෙහි ප්‍රධාන ශාන්ති කර්මය වනුයේ මඩු ශාන්ති කර්මයයි. පහතරට නර්ථනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය යන්බෙරය ලෙස හඳුන්වනු ලැබේ. එක් එක් අංගයන් උදෙසා අඳින හලදින ලබන ආභරණ හා ඇඳුම් කට්ටල එකිනෙකට වෙනස් බව පෙනේ.

සබරගමු නර්තන කලාව සබරගමු පළාතේ රත්නපුර, කළවාන, පැල්මඩු-ල්ල, බලංගොඩ ආදී ප්‍රදේශ වල මෙම නර්තනය ප්‍රසිද්ධව නවතී. ප්‍රධාන ශාන්ති කර්මය වනුයේ පහන් මඩු සාගය වේ. දෙවිවරු ප්‍රධාන කොට ගෙන පවත්වනු ලබන සබරගමු නර්තනය ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දවුල වේ.

වෙස්මුහුණු කළාවේ ආරම්භය

කෝලම් —: ලෝකයේ විවිධ ජන ඇදහිලි මුල්කොට ගෙන පැවත යන වන් පිළිවෙන් බෝහෝ ය. ඒවා ආශ්‍රිතයෙන් බිහිවූ විවිධාකාර වූ යාග හෝම හා බලි නොවිල් නර්ථන කළාව හා බැඳී පවතී. ඒ අතරින් කෝලම් යනු ශ්‍රීලංකාවේ දකුණු පළාතේ වෙරළ බඩ ගම්මාන ආශ්‍රිත පැවත එන ගැමි නාට්‍ය විශේෂයක් වන අතර වෙස් මුහුණු කළාව හා සෘජුව සම්බන්ධ වන සම්ප්‍රදායක්වේ. කෝලම් නැටුමකට භාවිතා කරන වෙස් මුහුණු එකතුව 'කෝලම් කුට්ටම' ලෙස හැඳින්වෙන අතර එවැනි වෙස් මුහුණු කපා සකස් කර ගැනීම 'කෝලම් කැපීම' ලෙස ද හඳුන්වයි.

රනේ කිරුළ කුත් ගවි උස සළුව අදින මා
පෙනේ විදුලි සැර මල් දම් කරේ දිලෙන මා
ගෙනේ දකුණු අතට ඒ රන් කළය දරන මා
අනේ නාථ දෙවියනි මල් අස්න වඩින මා

දහ අට සන්නිය —: වෙස් මුහුණු කළාව ගාල්ල අම්බලන්ගොඩ නගරයේ ප්‍රචලිත වූ කළාවකි. එය ප්‍රධාන වශයෙන් බැඳී පවතින්නේ දහ අට සන්නිය නම් වූ පහතරට නර්ථන ශෛලයට වේ. සන්නි යකුම හා සැරසිලි ඇඳුම් පැළඳුම්, සරවාද මගින්, දකුණු පළාතට ආවේනික ගම් මඟු යාගය ඉතා ප්‍රසිද්ධියක් උසුලනු ලබයි. එක් එක් 'ගුරු කුලවලට' ආවේනික පරිදි සන්නි යකුන් සභාගත නිර්මේදී විවිධ වූ වෙනස්කම් දක්නට ලැබේ. නර්තන ශෛලීන් කුනටම වෙස් මුහුණු කළාව ආවේනික වුව ද දහ අට සන්නිය නර්තන කළාව තුළ වෙස් මුහුණු වල හැඩතල මනාව ඉස්මතුව පෙනේ. එය අපේ රටට ඉමහන් ගෞරව-යක් ගෙන දෙනු ලබයි. එමෙන්ම විදේශිකයන් ආකර්ෂණ-ය කර ගැනීම තුළින් විදෙස් විනිමය රටට ගලා එන ප්‍රධාන කළා කෘතියකි. දහ අට සන්නියට අයත් විවිධ ලෙඩ රෝග නිරූපණය කරන වෙස්මුහුණු 18ක් ඇත.

බුත අඛුත අමුත්තු වෙඩි වාතත්
බිහිරි බීත කණ පීත් ගොලු මූර්තිත්
දෙමළ ගුල්ම කොර ගිණිජල් සිතත්
නාග දේව දහ අට සන්නිය වෙත්.

දහ අට සන්නිය විස්තරාත්මකව

අමුක්කු සන්නිය

පිත බහුල වීමෙන් හා කෝප වීමෙන් මෙම සන්නිය හටගනී.

මූර්ත සන්නිය

වරින් වර සිහි මූර්ඡා වීම මෙම සන්නියෙන් පෙන්වයි.

නාග සන්නිය

විෂක් ශරීර ගත වීම හේතුවෙන් හටගන්නා ලෙඩ රෝග මෙම සන්නියෙන් පෙන්වයි.

දෙමළ සන්නිය

දෙමළ බසින් විකාර දෙඩවීම මෙයින් පෙන්නුම් කරයි.

ගිනිජාල් සන්නිය

විසරුව සිසිල අත දිවයාම, වරින්වර උණ ගැනීම අග්නි රෝගයෙන් ගිනි දර සැලෙන්න කිරීම මෙම සන්නියෙන් පෙන්වයි.

සීතල සන්නිය

අත පය වෙව්ලීම, ඇඟ සීතල වීම යන රෝග මෙලෙස සන්නියෙන් පෙන්වයි.

Philatelic Association of Sri Lanka (PASL)
www.philately.lk

බුන සන්නිය.

සිහිනෙන් බිය වී නැගැසීම, ඇසීම, තුළට ඇතිවීම මෙම සන්නියේ ලක්ෂණ වේ.

අබුන සන්නිය

මානසික රෝග සිහිමධ ගතිය අසුනා වේශ ඇති වීම මෙයින් පෙන්වයි.

බීන සන්නිය.

බිය වීම හේතුකොට ගෙන බීරාන්න වී සිහි මදු ගතියෙන් සිටීම බීන සන්නියෙන් පෙන්නුම් කරයි.

බිහිරි සන්නිය.

සෙම බහුල වී අධික සීතලට කන් බිහිරි වීම මෙයින් පෙන්වයි.

ගොලු සන්නිය.

අන් දමන්දව දෙඩවීම, රාත්‍රියේ නින්දු නොයාම, මලබද්ධය එයින් පෙන්වයි.

කොර සන්නිය

අන පය හා ඇඟිලි කොර වීම, මුස් පිණු පෙරලීම මෙයින් පෙන්නුම් කරයි.

වාත සන්නිය.

ශරීරයේ වාතය කෝප වීම නිසා ඇතිවන ලෙඩ මෙයින් පෙන්වයි.

වෙඩි සන්නිය.

අග ගිනි ගෙන දැවෙන්නාන් මෙන් දැනීම මෙලගින් පෙන්වයි.

පිත් සන්නිය.

ශරීරයේ පිත කිපීම නිසා උණ, සිහිමද ගතිය ඇති වීම මෙයින් පෙන්වයි.

කන සන්නිය.

ඇස් පෙනීම දුර්වල වීම, නිදි මත ගතියෙන් දෙඩ-වීම මෙයින් පෙන්වයි.

ගුල්ම සන්නිය.

ආමාශගත වූ ගුල්ම පණුවා ජීරණ පද්ධතියේ ඇතිකරන ලෙඩ රෝග මෙමගින් පෙන්නුම් කරයි.

දේව සන්නිය.

ශරීරය දැවිල්ල වීම, නෙත් ඉදිරි-යට නෙරාවීම, මල බද්ධය ඇති වීම මෙයින් පෙන්වයි.

දහ අට සන්නියේ සිහිවටන පත්‍රිකා.

නර්තනය හා බැඳුණු සාම්ප්‍රදායික පෙරහැර

සාම්ප්‍රදායික නර්තන අංගයන්ගෙන් හා වෙස්මුහුණු කලාවෙන් වර්ණවත් වූ ශ්‍රී ලංකාවේ ප්‍රධානතම පෙරහැර ලෙස ඇසළ පෙරහැර ලොව ප්‍රසිද්ධියක් උසුලනු ලබයි. නර්තන රටාවන් තුනටම අදාළ විවිධ වූ ශෛලීන්ගෙන් නර්තන හැකියාවන්ට දක්ෂ වූ ශිල්පීන් රැසකගේ දායකත්වයෙන් සෑම වසරකම අති උත්කර්ෂවත් ලෙස ඇසළ පෙරහැර වීදි සංචාරය කරනු ලබයි. වර්ෂ 2024 දී පවත්වනු ලැබූ ඇසළ පෙරහැර අදාළව එනි ඡායා රූපයක් ලොව දිගම තැපැල් මුද්දරය ලෙස ප්‍රකාශිත දා නම්කෙරිණ.

Philatelic Association of Sri Lanka (PASL)
www.philately.lk

08